# <u>කලුගල් ද්‍රව්‍ය සැපයුම්කරුවන් සඳහා උපදෙස් පත්‍රිකාව</u>

**වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව**
**පරිසර අමාත්‍යාංශය**

1. වෙරළ ආරක්ෂණ ව්‍යූහ ඉදිකිරීම සඳහා 2026 වර්ෂයට කලුගල් ද්‍රව්‍ය සැපයීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදංචි වීමට කැමති සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා ආරාධනය කරනු ලැබේ.

2. වෙරළ සංරක්ෂණ වැඩබිම් වලට අවශ්‍ය පහත සඳහන් කලුගල් ද්‍රව්‍ය සැපයීම සඳහා ලියාපදංචි කිරීමට 2025 .12. 15 වන දින සිට 2025. 12. 31 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

| **දෙපාර්තමේන්තුවට අවශ්‍ය වන කලුගල් ද්‍රව්‍ය** |
|---|
| කුට්ටිගල් (බර පරාසය ටොන් 0.5 සිට ටොන් 5.0 දක්වා) |
| (මි.මී. 150 – 225) 6" x 9" ප්‍රමාණයේ සක්කගල් |
| මිශ්‍රගල් කි.ග්‍රෑ. (2-250) බර පරාසය |
| මිශ්‍රගල් කි.ග්‍රෑ.(10-500) බර පරාසය |

ඉහත සඳහන් කලුගල් ද්‍රව්‍ය සඳහා අවශ්‍ය ප්‍රමාණයන් හා ඒ හා සම්බන්ධ පිරිවිතර එක් එක් ව්‍යපෘතියේ අවශ්‍යතාවය පරිදි දැනුම් දෙනු ලැබේ.

3. ලියාපදිංචි වීමට අපේක්ෂා කරන සැපයුම්කරුවන් විසින් තම ආයතනයේ නම සඳහන් ලිපි ශීර්ෂයක් සහිත ලිපියක් මඟින් අයදුම්පත ඉදිරිපත් කල යුතුවේ. **ආපසු ගෙවනු නොලබන රු. හාරදහසක (Rs.4,000.00) ගාස්තුවක් මුදලින් හෝ "අධ්‍යක්ෂ ජනරාල් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ" ගිණුම් අංක 07042641 නමට කරන ලද බැංකු තැන්පතුවක්** මඟින් ගෙවිය යුතු වන අතර, අයදුම්පත සමග එම මුදල් ගෙවූම් ලදුපත/ බැංකු රිසිට්පත ඉදිරිපත් කල යුතුය. ලියාපදිංචි ගාස්තුව මුදලින් ගෙවන්නේනම් රාජකාරී දිනවල පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවිය යුතුය.

4. අයදුම්පත්, ලිපිකවරයේ වම් පස ඉහළ කෙලවරේ **"2026 වර්ෂය සඳහා වෙරළ ආරක්ෂණ ව්‍යූහ ඉදිකිරීම සඳහා කලුගල් ද්‍රව්‍ය සැපයීමට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම"** යනුවෙන් පැහැදිලිව සටහන් කර පහත සඳහන් ලිපිනයට **2026.01.01** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ කළ යුතුය.

   ලිපිනය : අධ්‍යක්ෂ ජනරාල්,
   වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
   නව මහලේකම් කාර්යාලය, 4වන මහල,
   මාලිගාවත්ත, කොළඹ 10.

5. අයදුම්පත් පහත සඳහන් ස්ථානයන්හිදි ලබා ගත හැක.
   - නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 පිහිටි වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ වෙරළ සංවර්ධන අංශයෙන්.

- මීගමුව, මොරටුමෝදර, ගාල්ල, මාතර, ත්‍රිකුණාමලය, මඩකලපුව, යාපනය සහ අම්පාර පිහිටි වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල වලදී.
- දෙපාර්තමේන්තු වෙබ් අඩවිය www.coastal.gov.lk

6. <u>කලුගල් ද්‍රව්‍ය සැපයුම්කරුවන් විසින් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළයුතු ලිපි ලේඛන</u>

| |
|---|
| ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක් |
| ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා භාවිතා කරනු ලබන අයදුම්කරු සතු හා කුලී/බදු පදනම මත ලබාගත් යන්ත්‍රෝපකරණ, ටිපර් රථ, ඩම්ප් ට්‍රක්රථ සහ වෙනත් වාහන පිළිබඳ ලැයිස්තුවක් |
| අයදුම්කරුට අයත් හෝ බදු පදනම මත ක්‍රියාත්මක කරන ගල් කොරි පිළිබඳ විස්තර |
| අයදුම්කරුට ගල් කොරි වල හිමිකම නැති නම්, කලුගල් ද්‍රව්‍ය සැපයීම සඳහා ගල් කොරි හිමිකරුවන් සහ අයදුම්කරු අතර ඇති කරගත් ගිවිසුම් / එකගතා වල පිටපත් |
| පසුගිය වසර දෙක (02) තුළ මෙම දෙපාර්තමේන්තුව හෝ වෙනත් ආයතන වලට ඉටුකරන ලද කලුගල් ද්‍රව්‍ය සැපයුම් පිළිබඳ ලැයිස්තුවක් |
| VAT බදු ලියාපදිංචි සහතිකයේ පිටපතක් (ලියාපදිංචි වී ඇත්නම් පමණි) |

7. මෙම සැපයුම් කොළඹ, ගම්පහ, පුත්තලම, මන්නාරම, යාපනය, කිලිනොච්චි, මුලතිවු, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, හම්බන්තොට, මාතර, ගාල්ල සහ කළුතර යන වෙරළබඩ දිස්ත්‍රික්ක සඳහා අවශ්‍ය වනු ඇත. අයදුම්කරුවන්ට කලුගල් ද්‍රව්‍ය සැපයීමේ තම හැකියාව අනුව දිස්ත්‍රික්ක සියල්ලටම හෝ කීපයකට පමණක් හෝ ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කළ හැක.

8. මෙම වර්ෂය (2025) තුළ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සැපයුම්කරුවන් 2026 වර්ෂය සඳහාද නැවත අයදුම් කළ යුතුය.

9. මූලික සුදුසුකම් සපුරන අයදුම්කරුවන් දෙපාර්තමේන්තුව විසින් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ දිනය ඔබ වෙත ලිපියක් මගින් දැනුම් දීමට කටයුතු කරනු ලැබේ.

10. අයදුම්පත් භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දෙපාර්තමේන්තුව සතුය. සියලු පැහැදිලි කර ගැනීම් සහ විමසීම් පහත ලිපිනය වෙතින් ලබා ගත හැකිය.

    ප්‍රධාන ඉංජිනේරු (වෙරළ සංවර්ධන),
    වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,
    නව මහලේකම් කාර්යාලය, 4 වන මහල, මාළිගාවත්ත, කොළඹ 10.
    දුරකථන: 011-2472622 / විද්‍යුත් තැපැල : coastaldevelopmentcd@gmail.com